සමාජ මාධ්‍ය තුළ ද කතාබහකට ලක් වූ, බුද්ධි ප්‍රබෝධ ගේ මරණය සම්බන්ධයෙන් පළ වූ, දිනමිණ කතුවැකිය ඇතුළු පුවත් වාර්තාවන් තුළ තිබූ මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයන් Ethics Eye අපි පෙන්වා දී ඇත්තෙමු.
මේ අතර, අප්‍රේල් 23, 2023 දින සිළුමිණ පුවත්පත ද එම මරණය සම්බන්ධයෙන් කාටූනයක් පළ කර ඇත.
මෙම කාටූනය තුළ, "අරගලයට මුල පිරූ නායකයෙක් දිවිනසාගෙන" යනුවෙනුත්, එසේම, "අරගලයේ නායකයෝ මෙහෙම බව අපි නම් කලින්ම දැනගෙන සිටියා" යනුවෙනුත් සඳහන් වේ.
දිවි තොර කරගැනීම් යනු මහජන සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් සලකමින්, සංවේදී ලෙසින් ඒ සම්බන්ධයෙන් වාර්තා කරන මෙන්, ලෝක සෞඛ්‍ය සංවිධානය, සමාරිටන්ස් ඇතුළු සංවිධාන මාධ්‍ය වෙත උපදෙස් දෙනු ලැබේ.
එසේ බලන විට,
මෙම සිළුමිණ කාටූනය අදාල දිවි තොර කරගැනීමසම්බන්ධයෙන් අසංවේදී අදහස් දැක්වීමක් යැයි ඔබ නොසිතන්නේ ද?
හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

